සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 3

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021 නොවැම්බර් මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 20. තමන්ටත් අනුන්ටත් හිතැති බොදු දරුවන් වෙමු.

ආදර දූ දරුවනි ඔයාලා හැමෝම හොඳ බොදු දරුවෝ කියලා මම දන්නවා.අපි ළඟ තියෙන හොඳ ගතිගුණ තවත් වැඩිකර ගන්න උදවු වන පාඩමක් තමයි පුතේ පෙළපොතේ 20 වන පාඩම.

අපි හැමෝම ඒ පාඩම කියවමු. දැන් මේ ප්‍රශ්න ටිකට පිළිතුරු ලියමු.

1) යම් තරගයකින් ජය ගත් අයෙක් හෝ කණ්ඩායමක් ලග තිබිය යතු යහපත් ගුණාංග 2ක් ලියන්න.
2) යම් අවස්ථාවක අපට පරාජයක් අත් වුවහොත් අප ක්‍රියා කළ යුතු ආකාර 2ක් ලියන්න.
3) කරණීයමෙත්ත සූත්‍රයේ දක්වා ඇති ආකාරයට වගකීම් දරන ශිෂ්‍යයෙකු තුළ තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න
4) අප්‍රිය , අමනාප වචන ඇසීමට සතුන්ද අකමැති බව කියවෙන ජාතක කතාව කුමක්ද?
5) පෙළපොතේ 98 පිටුවේ ඇති ලෝවැඩ සගරාවේ එන කවිය පාඩම් කර ගන්න.

ඔබත් නිතරම ප්‍රිය වචන කතා කිරීමට ,අනුන්ගේ දේවල් නොගෙන සිටීමට වගකීමෙන් වැඩ කිරීමට පුරුදු වෙන්න.

බුද්ධ ධර්මය විෂයට අදාළ වඩියෝ **enanapiyasa** වෙබ් අඩවියේ සුහුරු පාඩම් යටතේ ලබාගත හැකිය